

# 17 හේතුව ඵලය වෙයි ඵලය හේතුව වෙයි

පාසල් නිවාඩුව සමග අපගේ වර්ෂාවසාන විභාගයේ ප්‍රතිඵල ලබා දුන් අද මට ඉතා ම ප්‍රීතිමත් දිනයකි. පන්තියේ අනෙක් සිසුනට වඩා මා බෙහෙවින් ම සතුටු වන්නේ මා පන්තියේ පළමුවෙනියා වීම නිසා ය. පසුගිය වර්ෂයේ පන්තියේ අටවෙනියා වී සිටි මා මෙවර පන්තියේ පළමුවෙනියා වීම පිළිබඳ පන්තිභාර ගුරුතුමිය මට බොහෝ සේ ප්‍රශංසා කළා ය. එතුමිය මා පන්තිය ඉදිරියට කැඳවා පසුගිය වතාවේ අටවෙනියා වූ මා මෙවර පළමුවෙනියා වූයේ කවර හේතු නිසා දැයි ප්‍රකාශ කරන ලෙස දන්වා සිටියා ය. මා වෙනදාට වඩා මහන්සියෙන් හා උත්සාහයෙන් කටයුතු කළ අයුරු, විස්තර කර ගුරුවරුන්ට කීකරුව සිටි නිසා හොඳ ප්‍රතිඵල ලබන්නට හැකි වූ බව පන්තිය ඉදිරියේ ප්‍රකාශ කළේ මහා වීරයකු ලෙසිණි.

එසේ පන්තිය ඉදිරියේ ගුරුතුමිය කරුණු දක්වන විට මට අපේ දහම් පාසලේ ලොකු හාමුදුරුවන් වහන්සේ කියා දුන් **කිසිවක් අහේතුකව ඉබේ සිදුවන්නේ නැත. හැම දෙයකට ම හේතුඵල ධර්මය අදාළ වේ** යන පාඩම සිහිපත් විය. මම එම කරුණු ද පදනම් කරගෙන අදහස් දැක්වූයෙමි. මම හොඳින් පාඩම් කළ නිසා විභාගය හොඳින් සමත් වූයෙමි. පාඩම් වැඩ නිසි අයුරින් නොකළා නම් අසමත් වෙන්නට හෝ ලකුණු අඩු වෙන්නට ඉඩතිබුණි. එමගින් කියවෙන්නේ හැම දෙයකට ම බලපාන හේතුවක් තිබෙන බවයි. හේතුව හොඳ නම් ප්‍රතිඵලය හොඳ වේ. හේතුව අයහපත් නම් ප්‍රතිඵලය ද අයහපත් වේ. මෙය ලෝකයේ සෑම දෙයකට ම පොදු ධර්මතාවකි. බුදුරජාණන් වහන්සේ දේශනා කළ පටිච්ච සමුප්පාද ධර්මයෙන් දැක්වෙන්නේ ද එබඳු හේතුඵල සබඳතාවකි. සත්ත්වයා සසර ඇවිදින්නේ ද මෙම හේතුඵල ධර්මය හරි හැටි තේරුම් නොගැනීම නිසා ය. හේතුඵල ධර්මය හෙවත් පටිච්ච සමුප්පාද ධර්මය ඇතුළත් කෙටි සූත්‍ර දේශනාවක් ද ඇතැයි එදා උගත් දේ මම මෙහි සටහන් කරමි.

| | |
|---|---|
| **ඉමස්මිං සති ඉදං හෝති** | මෙය ඇති කල්හි මෙය වේ. |
| **ඉමස්ස උප්පාදා ඉදං උප්පජ්ජති** | මෙය හට ගැනීමෙන් මෙය හට ගනී. |
| **ඉමස්මිං අසති ඉදං න හෝති** | මෙය නැති කල්හි මෙය නොවේ. |
| **ඉමස්ස නිරෝධා ඉදං නිරුජ්ඣති** | මෙය නැතිව යාමෙන් මෙය නැති ව යයි. |

මෙම පටිච්ච සමුප්පාද සූත්‍රය ඉතා කෙටි වුව ද මෙමගින් ගම්‍ය වන අර්ථය ඉතා පුළුල් වූවකි. "මෙය ඇති කල්හි මෙය වේ" යන්න සරල නිදසුනකින් මෙසේ දැක්විය හැකි ය. වලාකුළු ඇති කල වැස්ස ඇති වේ. වැස්ස ඇති කල තෙතමනය ඇති වේ. තෙතමනය ඇති කල තුරුලතා ඇති වේ. තුරුලතා ඇති කල වලාකුළු ඇති වේ. ස්වභාව ධර්මය ආශ්‍රිත මෙම ක්‍රියාවලිය තුළින් කියවෙන්නේ මෙය ඇති කල මෙය ඇති වේ. මෙය හටගැනීමෙන් මෙය හටගනී යන්නයි. නොඑසේ නම් මේ හේතුවෙන් මේ ඵලය වේ යන විද්‍යාත්මක සත්‍යයයි.

එසේ ම වලාකුළු නැති කල වැස්ස නැත. වැස්ස නැති කල තෙතමනය නැත. තෙතමනය නැති කල තුරුලතා නැත. තුරුලතා නැති කල වලාකුළු නැත යන්න ද සොබාදහම පිළිබඳ විද්‍යාත්මක සත්‍යයකි. එයට මුල් වී ඇත්තේ මෙය නැති කල්හි මෙය නැත. මෙය හට නො ගැනීමෙන් මෙය හට නොගනී යන්නයි. නොඑසේ නම් හේතුව නැති කල ඵලය නැත යන්නයි.

සංජය පිරිවැජියාගෙන් වෙන්ව සත්‍යය සොයා ගිය කෝලිත උපතිස්ස දෙදෙනාගෙන් දෙවැන්නාට පිණ්ඩපාතයේ වඩින පස්වග භික්ෂූන් වහන්සේලා අතුරින් අස්සජි හිමියන් හමුවිය. ඒ අවස්ථාවේ දී ඔබගේ ගුරුවරයා කවුද? ඔබ පිළිගන්නා දහම කුමක් දැයි උපතිස්ස විමසූ විට අස්සජි හිමියන් දුන් පිළිතුර මෙසේ ය.



**යේ ධම්මා හේතුප්පභවා**
**තේසං හේතුං තථාගතෝ ආහ**
**තේසං ච යෝ නිරෝධෝ**
**ඒවං වාදී මහා සමණෝ**

හේතු නිසා හට ගන්නා යම් ධර්මතා වෙත් ද ඒවායේ හේතුව බුදුරජාණන් වහන්සේ වදාළහ. එසේ ම එම ධර්මතාවන්ගේ සපුරා නැතිවීමක් වෙත්නම් එය ද ශාස්තෘවරයාණන් වහන්සේ දේශනා කරන බව අස්සජී හිමියෝ උපතිස්ස පිරිවැජියාට පැවසූහ. එයින් ප්‍රකාශ වූයේ ද පටිච්ච සමුප්පාද ධර්මය ම වේ. එහි අර්ථය වටහා ගත් උපතිස්ස පරිබ්‍රාජකයා මාර්ගඵල අවබෝධ කිරීමට පවා සමත් විය. පසු කාලයේ දී සැරියුත් මහරහතන් වහන්සේ නමින් ප්‍රකට වූයේ ද උන් වහන්සේයි.

බුද්ධත්වයෙන් පළමු සතියේ බෝමැඩ වැඩ සිටි බුදුරජාණන් වහන්සේ හේතු ප්‍රත්‍ය නිසා සසර දුක් ඇති වන ආකාරයත් හේතු ප්‍රත්‍ය නැති වීමෙන් සසර දුක් නැති වන ආකාරයත් අනුලෝම පටිලෝම වශයෙන් මෙනෙහි කළහ. එයින් පැහැදිලි වන්නේ බුදුරදුන් පසක් කළ ධර්මයෙහි හරය එසේ මෙනෙහි කළ බව ය. තමන් අවබෝධ කර ගත් මෙම ගැඹුරු දහම අවිද්‍යාවෙන් අන්ධ ව තෘෂ්ණාවෙන් මුසපත් ව සිටින මිනිසුන්ට අවබෝධ නොවනු ඇතැයි විමතියක් ද උන් වහන්සේට ඇති විය. එතැන ද දහම ලෙස දක්වෙන්නේ පටිච්ච සමුප්පාදයයි. බුදුවරුන් ලොව උපන්න ද නූපන්න ද පවත්නා පරම සත්‍යය නම් මෙකී හේතුඵල ධර්මයයි. බුදුවරු පහළ වී එම සත්‍ය හෙළිකරති. යමෙක් මෙම පටිච්ච සමුප්පාද ධර්මය අවබෝධ කරන්නේ ද හෙතෙම බුද්ධ ධර්මය අවබෝධ කරන්නේ ය. යමෙක් බුද්ධ ධර්මය අවබෝධ කරන්නේ ද හෙතෙම පටිච්ච සමුප්පාද ධර්මය අවබෝධ කරන්නේ ය.

මෙම පටිච්ච සමුප්පාද ධර්මය හෙවත් හේතුඵල දහම බුදුරජාණන් වහන්සේ සත්ත්වයාගේ සසර දුක ඇතිවීම හා නැතිවීම පිළිබඳව දේශනා කළ දහමක් වුව ද එය ලෝකයේ සියල්ල හා බැඳේ. කායික මානසික, බාහිර අභ්‍යන්තර, සචේතනික අචේතනික, සජීවී අජීවී සියල්ල ම හේතු ප්‍රත්‍ය ඇති කල ඇති වේ. නැති කල නැති වේ. සෑම කරුණක් පිළිබඳව ම විමසා බැලීමේ දී මෙම හේතුඵල සම්බන්ධතාව දැක ගත හැකි වේ. ගැටලු ඇති වන්නේ හේතු ප්‍රත්‍ය ඇතිව ය. එම ගැටලු විසඳෙන්නේ ද එම හේතු ප්‍රත්‍ය නැති වූ විට ය. සමාජයේ දැක ගත හැකි ප්‍රාණඝාත, අදත්තාදාන, මුසාවාද ආදි ඕනෑ ම අපචාර ක්‍රියාවකට හේතු ප්‍රත්‍ය ඇත. ඒ කිසිවක් ඉබේ හට ගන්නේ නැත. කිසියම් අද්භූත බලයකින් ඇති වන්නේ ද නැත. එසේ ම හේතු ප්‍රත්‍ය නැති වීමෙන් එම දුසිරිත් ද නැති වී යයි.

මෙය ඇති කල්හි
මෙය වේ. (ඉමස්මිං සති ඉදං හෝති)

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| මෙය හට ගැනීමෙන් මෙය හට ගනී | → | අවිජ්ජා පච්චයා සංඛාරා..... | → | අනුලෝම දේශනාව | → | සසර දුක් ඇති වන සැටි |

(ඉමස්ස උප්පාදා ඉදං උප්පජ්ජති)

මෙය නැති කල්හි
මෙය නැත. (ඉමස්මිං අසති ඉදං න හෝති)

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| මෙය නැතිව යාමෙන් මෙය නැතිව යයි. | → | අවිජ්ජාය නිරෝධා සංඛාරා නිරෝධා | → | පටිලෝම දේශනාව | → | සසර දුක් නැතිවන සැටි |

(ඉමස්ස නිරෝධා ඉදං නිරුජ්ඣති)

මිනිසුන් සමාජයේ දී දුරාචාරකම්, වැරැදි වැඩ, සොරකම් ආදිය සිදු කරන්නේ ඇයි ද යන්න පිළිබඳ විමසා බැලීමේ දී මෙම ගැටලුවලට විසඳුම් සොයා ගත හැකි වේ. දුප්පත්කම නිසා, නූගත්කම නිසා, මිනිස්සු බොහෝ විට වැරැදි වැඩ කිරීමට පෙළඹෙති.

බුද්ධ දේශනාව අනුව දිළින්දන්ට ආර්ථික පහසුකම් නොසලසන විට දිළිඳුකම වැඩි වේ. දිළිඳුකම නිසා මිනිස්සු සොරකම් කරති. සොරකම් නිසා ආයුධ ගනිති. මුසාබස් කියති. රජුන් විසින් සොරුන් මැඩලීම පිණිස නීති ක්‍රියාත්මක කරනු ලබන විට පරපණ නැසීමට සිදුවේ. මෙසේ දිළිඳුකම ඇති කල සොරකම ඇත. සොරකම ඇති කල අවි ආයුධ ගැනීම් ඇත. ඒ ආකාරයෙන් සමාජයේ නොයෙක් අකුසල ධර්ම පැතිර යන්නේ එකිනෙකට බලපාන හේතු ප්‍රත්‍ය නිසා ය. මේ අයුරින් තණ්හාව නිසා සෙවීම ඇති වේ. සෙවීම නිසා ලැබීම වේ. ලැබීම නිසා ඇගයීම වේ. ඇගයීම නිසා බැඳීම වේ. බැඳීම නිසා මගේ යැයි සිතේ. එයින් ආරක්ෂාව තර කෙරේ. එහි දී අවි අයුධ භාවිත කරනු ලැබේ. එවිට කල කෝලාහල ඇති වේ. මෙසේ ලෝකයේ හේතුඵල දහම අනුව කරුණු කාරණා සිදු වන ආකාරය පිළිබඳ තොරතුරු චක්කවත්ති සීහනාද සූත්‍රය, මහා නිදාන සූත්‍රය ආදී සූත්‍ර කිහිපයක ම සඳහන් වේ.

මෙම පටිච්ච සමුප්පාද ධර්මය මනාව අවබෝධ කරගෙන කටයුතු කිරීමෙන් සමාජයේ ඇති ගැටලු බොහොමයකට විසඳුම් සොයා ගත හැකි වේ. පාසල් යන දරුවන් ලෙස අපට ද හේතුඵල දහම අපේ අධ්‍යාපන කටයුතු සාර්ථක කර ගැනීමට ආධාර කර ගත හැකි ය. පාඩම් නොකරන දරුවෝ විභාගයෙන් අසමත් වෙති. පාඩම් කරන අය විභාගය හොඳින් සමත් වෙති. හොඳ වැඩ කරන දරුවෝ සමාජයේ ගෞරවාදරයට ලක් වෙති. වැරැදි වැඩ කරන දරුවෝ සමාජයේ අපවාදයට ලක් වෙති. මේ ආකාරයට ලෝකයේ සියල්ල හේතුඵල සම්බන්ධතාව අනුව සිදුවන බව මනාව පැහැදිලි වේ.

## සාරාංශය

'යමෙක් පටිච්ච සමුපාද ධර්මය දකී නම් හෙතෙම ධර්මය දකී. යමෙක් ධර්මය දකී නම් හෙතෙම පටිච්ච සමුප්පාද ධර්මය දකී' යනුවෙන් බුදුරජාණන් වහන්සේ දේශනා කළ සේක. එයින් පැහැදිලි වන්නේ පටිච්ච සමුප්පාදය හෙවත් හේතුඵල දහම බුදුසමයේ මූලික ඉගැන්වීමක් බවයි. හේතුඵල ධර්මය අපගේ එදිනෙදා ජීවිතයට ද සම්බන්ධ කර ගත හැකි ය. අපගේ ප්‍රශ්න ඇති වීමට හේතුව කුමක් ද යන්න සොයාගෙන එය විසඳා ගැනීමට මෙන් ම සමාජයේ සියලු ගැටලු සඳහා ද මේ න්‍යාය උපයෝගී කරගෙන විසඳුම් සොයා ගත හැකි වේ. මෙසේ පටිච්ච සමුප්පාදය ප්‍රායෝගික දහමක් ලෙස අප ජීවිතයට සම්බන්ධ කර ගත හැකි වේ.

## ක්‍රියාකාරකම

1. පටිච්ච සමුප්පාද කෙටි සූත්‍රය හා එහි තේරුම මතකයෙන් කියන්න.
2. ඔබගේ ජීවිතය හා බැඳුණු කරුණක් පදනම් කරගෙන එය පටිච්ච සමුප්පාද ධර්මය හෙවත් හේතුඵල දහම අනුව විග්‍රහ කර පෙන්වන්න.

## පැවරුම

- "පටිච්චසමුප්පාදය උගන්වන හේතුඵල සම්බන්ධය සෑම දෙයක් හා බැඳී පවතී." මෙය පැහැදිලි කරමින් කතාවක් කරන්න.